කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2023
2026 ජනවාරි / පෙබරවාරි

**සමාජීය විද්‍යා පීඨය**

**සංවර්ධන අධ්‍යයන**
**(නව නිර්දේශය)**

**තිරසර සංවර්ධනය සඳහා ක්‍රමෝපායන්**
**DVST 38214**

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ගෝලීය සංවර්ධනයේ ප්‍රගතිය උදෙසා තිරසර සංවර්ධනය සඳහා වූ ක්‍රමෝපායන් අනුගමනය කිරීමේ ඇති වැදගත්කම උදාහරණ ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 20)

02. තිරසර සංවර්ධනය ගොඩනැගී ඇති ප්‍රධාන කුළුණු තුනෙහි තුලනතාව තිරසර සංවර්ධනයකට මගපෙන්වන ආකාරය විවරණය කරන්න. (ලකුණු 20)

03. සමාජ සාධාරණත්වය සාධනය කර ගැනීම සඳහා ඉවහල් වන ක්‍රමෝපායන් දෙකක් (02) උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 20)

04. සංවර්ධනය වෙමින් පවතින රටවල තවමත් පවතින දරිද්‍රතාව මුලිනුපුටා දැමීමට පවතින ප්‍රධාන අභියෝග හතරක් (04) නිශ්චිත උදාහරණයක් ඇසුරෙන් විග්‍රහ කරන්න. (ලකුණු 20)

05. දේශගුණ විපර්යාස අවම කිරීම සඳහා ගෝලීය මට්ටමින් ගෙන ඇති ක්‍රමෝපායන් හතරක (04) ප්‍රගතිය පරීක්ෂා කරන්න. (ලකුණු 20)

06. තිරසර කෘෂිකාර්මික ක්‍රමෝපායන් අනුගමනය කිරීම ගෝලීය ආහාර සුරක්ෂිතතාවයට හේතුවන ආකාරය නිදසුන් හතරක් (04) ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 20)

07. රටක සංවර්ධනයේ තිරසරත්වය කෙරෙහි පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් කෙරෙහි යොමුවීම උපායමාර්ගික වශයෙන් වැදගත් වන ආකාරය තෝරාගත් රටක් ඇසුරින් විග්‍රහ කරන්න. (ලකුණු 20)

08. තිරසර සංවර්ධන අභිමතාර්ථ ජයගැනීම සඳහා ශ්‍රී ලංකාව හමුවේ පවතින අභියෝග හතරක් (04) සහේතුකව සාකච්ඡා කරන්න. (ලකුණු 20)

**********************************